www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 1968: ප්‍රන්ස මහා වැඩවර්ජනය සහ ශිෂ්‍ය කැරැල්ල

## තෙවන කොටස - ඇලේන් ක්‍රිවින්ගේ ජේසීආර් සංවිධානය ස්ටැලින්වාදයේ පාවාදීම් ආවරනය කලේ කෙසේ ද?

### 1968: The general strike and student revolt in France
### Part 3—How Alain Krivine's JCR covered for the betrayals of Stalinism (1)

**පීටර් ෂ්වාට්ස් විසිනි**

**2008 ජූලි 5**

*මෙහි පලවන්නේ 1968 ප්‍රන්ස මැයි-ජූනි සිද්ධීන් පිලිබඳව පලවන ලිපි මාලාවක තුන්වන කොටසයි. මැයි 28 දා පලකල පලමු කොටස මැයි මාසය අවසන් භාගයේ කූටයට ලඟාවූ ශිෂ්‍ය කැරැල්ලේ සහ මහා වැඩ වර්ජනයේ වර්ධනය විභාග කරයි. මැයි 29 දා පලකල දෙවන කොටස ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂය සහ එමගින් පාලිත සීජීටී වෘත්තීය සමිතිය තත්වය පාලනය කරගැනීමට ජනාධිපති චාල්ස් ඩි ගෝල්ට උපකාරී වූ අයුරු විභාග කරයි. තුන්වන සහ හතරවන කොටස් පැබ්ලෝවාදීන්ගේ භූමිකාව විමසා බලයි. අවසන් කොටස පියරේ ලොම්බෙයාගේ ජාත්‍යන්තර කොමියුනිස්ට් සංවිධානය පිලිබඳව විමසයි.*

1968 මැයි මාසයේ ජනාධිපති ඩි ගෝල් සහ ඔහුගේ පස්වන සමූහාන්ඩුවේ කල් පැවැත්ම පිලිබඳව ස්ටැලින්වාදී ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂය (ප්‍රකොප) ට සහ එහි වෘත්තීය සමිති හස්තය වන මහා කම්කරු සම්මේලය (සීජීටී) ට නයගැති ය. 1945 සහ 1968 අතර කාලයේ ප්‍රකොපයේ බලපෑම පැහැදිලිව ම අඩු වී ගොස් තිබිනි. මහා වැඩවර්ජනයේ ගෙල මිරිකීම සඳහා ස්ටැලින්වාදීන් රැඳී සිටියේ වඩා රැඩිකල් ආස්ථානයක් දැරූ නමුත් මහජන ව්‍යාපාරය මත ප්‍රකොපයේ ආධිපත්‍යය සහතික කල අනෙකුත් දේශපාලන බලයන්ගේ සහයෝගය මත ය.

මේ අංශයේ දී මූලික භූමිකාවක් ඉටුකලේ අර්නස්ට් මැන්ඩල් නායකත්වය දැරූ පැබ්ලෝවාදී එක්සත් ලේකම් මන්ඩලය සහ එහි ප්‍රන්ස ආධාරකරුවන් වූ ඇලේන් ක්‍රිවින් විසින් නීත විප්ලවවාදී කොමියුනිස්ට් තරුනයෝ (ජේසීආර්) හා පියරේ ෆ්‍රැන්ක් විසින් නීත ජාත්‍යන්තර කොමියුනිස්ට් පක්ෂය (පීසීඅයි) යන ඒවා ය. තරුන රැඩිකලීකරනය ගැඹුරු විප්ලවවාදී විකල්පයක් බවට වර්ධනය වීම වැලැක්වූ ඔවුහු එමගින් මහා වැඩවර්ජනය පාලනය කර ගැනීමට ස්ටැලින්වාදීන්ට උපකාර වූහ.

සෝවියට් රතු හමුදාව නාසි ජර්මනිය පරදවා ලත් ජයත් ෆැසිස්ට් විරෝධී රෙසිස්ටන්ට් (විරෝධය) ව්‍යාපාරය තුල ප්‍රන්ස පක්ෂයේ ම ක්‍රියාකලාපයත් හේතු කොටගෙන දෙවන ලෝක යුද්ධාවසානය වනවිට ප්‍රකොපය සැලකිය යුතු දේශපාලන අධිකාරයක් අත්පත් කරගෙන සිටියේ ය. විචි තන්ත්‍රයේ ස්වරූපයෙන් නාසීන් සමග සහයෝගී වීම නිසා ප්‍රන්ස ධනේශ්වරය තමන්ව ම අපකීර්තියට පත් කරගෙන සිටි අතර ප්‍රකොපයේ සාමාජිකත්වය දක්වා ම දිගු වූ සමාජවාදී සමාජයක් පිලිබඳ බලගතු අපේක්ෂාවක් කම්කරු පන්තිය තුල පැවතුනි.

කෙසේ වෙතත් එවක ප්‍රකොප නායකයා වූ මොරිස් තෝරෙස් තම සම්පූර්න දේශපාලන අධිකාරය ධනේශ්වර පාලනය ප්‍රතිස්ථාපනය සඳහා භාවිතා කලේ ය. යුද්ධයෙන් පසුව ඩි ගෝල් විසින් ස්ථාපනය කරන ලද පලමු ආන්ඩුවට පුද්ගලිකව ම සම්බන්ධ වූ තෝරෙස් රෙසිස්ටන්ට් ව්‍යාපාරය නිරායුධ කිරීම සඳහා උපකාරී විය.

පශ්චාත් යුද කාල පරිච්ඡේදයේ ධනේශ්වර සමාජය ප්‍රතිස්ථාපනය කිරීමේ දී ඉටු කල ක්‍රියාකලාපය හේතුවෙන් ප්‍රකොපයට තිබූ සහයෝගය ක්‍රමයෙන් පිරිහුනි. වියට්නාමයට සහ ඇල්ජීරියාවට එරෙහි විජිතවාදී යුද්ධවලට සහයෝගය පුදකර තිබුනු පක්ෂය 1956 දී ස්ටැලින්ගේ අපරාධ හෙලිදරවු කරමින් කෲෂෙව් කල කතාවෙන් පසු තව දුරටත් අපකීර්තියට පත් විය. එයට පසුව පැමිනියේ ස්ටැලින්වාදීන් විසින් හන්ගේරියාවේ සහ පෝලන්තයේ මහජන නැගිටීම් තිරස්චීන ලෙස මැඩීම යි. 1968 වනවිට ප්‍රකොපය තවමත් විශාලතම කම්කරු පන්තික සාමාජිකත්වය සහිත පක්ෂය වුවත් ශිෂ්‍යයන් සහ තරුනයන් අතර එහි ආධිපත්‍යය විශාල ලෙස ක්ෂය වී ගොස් තිබුනි.

විශේෂයෙන් ම කොමියුනිස්ට් ශිෂ්‍ය සම්මේලනය (යූර්සී) සිටියේ ප්‍රගාඪ අර්බුදයකට මුහුන පාමිනි. 1963 පටන් "ඉතාලියානු" (ග්‍රාම්ස්චි සහ ඉතාලි කොමියුනිස්ට් පක්ෂයේ ආධාරකරුවෝ), "මාක්ස්-ලෙනින්වාදී" (මාඕ සේතුංගේ ආධාරකරුවෝ) සහ "ට්‍රොට්ස්කිවාදී" ලෙස විවිධ කන්ඩායම් යූර්සීය තුල ඉස්මතු වූ අතර ඒවා නෙරපනු ලැබ තමන්ගේ ම සංවිධාන ගොඩනැගීමට

ඉදිරියට ගොස් තිබුනි. මෙම කාල පරිච්ඡේදය සලකුනු කරන්නේ 1968 ව්‍යාපාරය පිලිබඳ සිය ග්‍රන්ථය තුල ඉතිහාසඥ මිචෙල් සැන්කාරිනි-ෆෝනෙල් විසින් "ප්‍රකොපයෙන් සටන්කාමී තරුනයන්ගේ ක්‍රියාශීලී කන්ඩායමක භේදයේ ඉස්මතු වීම" දේශපාලන කරලිය තුල සටහන් කලා යයි සඳහන් ඊනියා "අන්ත වාමාංශයේ" සම්භවය යි. (1)

1968 දී සීජීටීයේ අධිකාරය ද වැඩිවන පීඩනය යටතේ පැවතුනි. ෆොස් ඕරියරේ සහ එවකට වාම-ප්‍රතිසංස්කරනවාදී එක්සත් සමාජවාදී පක්ෂයේ (පීඑස්යූ) අනුහස යටතේ පැවති ප්‍රන්ස ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු සම්මේලනය (සීඑෆ්ඩීටී) වැනි ප්‍රතිමල්ලව වෘත්තීය සමිති සටන්කාමී ඉරියව් පෑ අතර සීජීටීයට අභියෝග කලහ. සීඑෆ්ඩීටීය විශේෂයෙන් ම සේවා අංශය සහ රාජ්‍ය සේවාවන් තුලින් සහයෝගය රැලි කරගැනීමට සමත් විය.

මේ තතු යටතේ ස්ටැලින්වාදීන්ගේ අධිකාරය ආරක්ෂා කිරීමටත් මහා වැඩවර්ජනය පාවාදීම ශක්‍ය කිරීමටත් එක්සත් ලේකම් මන්ඩලය තුල සංවිධිතව සිටි පැබ්ලෝවාදියෝ අතිශය වැදගත් භූමිකාවක් ඉටු කලහ.

## පැබ්ලෝවාදයේ සම්භවයන්

1950 ගනන්වල මුල් භාගයේ පැබ්ලෝවාදී එක්සත් ලේකම් මන්ඩලය ඉස්මතු වූයේ හතරවන ජාත්‍යන්තරයේ ක්‍රියාමාර්ගයට එල්ල කරන ලද ප්‍රහාරයක ප්‍රතිඵලය වසයෙනි. හතරවන ජාත්‍යන්තරයේ ලේකම් මයිකල් පැබ්ලෝ, ලියොන් ට්‍රොට්ස්කි විසින් 1938 දී ගොඩනගන ලද හතරවන ජාත්‍යන්තරයට පදනම සැපයූ ස්ටැලින්වාදය පිලිබඳ සමස්ත විශ්ලේෂනය ම ප්‍රතික්ෂේප කලේ ය.

1933 ජර්මානු නිර්ධන පන්තියේ පරාජයෙන් පසු කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ස්ටැලින්වාදී පරිහානිය එම ජාත්‍යන්තරය ප්‍රතිසංස්කරනය කිරීම මත පදනම්වන කිසිදු පිලිවෙතක් අශක්‍ය කර ඇති බව ට්‍රොට්ස්කි නිගමනය කලේ ය. හිට්ලර් බලය ගැනීම හැකි කලා වූ ජර්මානු කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන පාවාදීම සහ පසුව කොමියුනිස්ට් ජාත්‍යන්තරය ජර්මානු ව්‍යසනයෙන් කිසිදු පාඩමක් උකහාගැනීම ප්‍රතික්ෂේප කිරීම මගින් ට්‍රොට්ස්කි නිගමනය කලේ කොමියුනිස්ට් පක්ෂ නිශ්චිතව ම ධනේශ්වරයේ කඳවුරට මාරු වී ඇති බව යි. විප්ලවවාදී අරගලවල අනාගතය නව කම්කරු පන්තික නායකත්වයක් ගොඩනැගීම මත රඳා පවතින බව අවධාරනය කල ඔහු හතරවන ජාත්‍යන්තරයේ ආරම්භක ක්‍රියාමාර්ගයේ මෙසේ ලිවී යඃ "මනුෂ්‍ය සංහතියේ සංස්කෘතියේ අර්බුදය බවට පත්ව ඇති කම්කරු පන්ති නායකත්වයේ අර්බුදය විසඳලනු ලැබිය හැක්කේ හතරවන ජාත්‍යන්තරයට පමනි."

පැබ්ලෝ මෙම දැක්ම ප්‍රතික්ෂේප කලේ ය. නැගෙනහිර යුරෝපයේ නව විකෘත කම්කරු රාජ්‍යයන් ඉස්මතුවීමෙන් ඔහු නිගමනය කලේ අනාගතයේ දී ස්ටැලින්වාදයට ඓතිහාසිකව ප්‍රගතිශීලී භූමිකාවක් ඉටු කලහැකි බවයි. එවැනි ඉදිරිදර්ශනයක් හතරවන ජාත්‍යන්තරය දියකර හැරීමට සමාන විය. පැබ්ලෝට අනුව ස්ටැලින්වාදී මහජන සංවිධානවලින් ස්වාධීනව හතරවන ජාත්‍යන්තරයේ ශාඛා ගොඩනැගීමට හේතුවක් නැත. ඒ වෙනුවට ට්‍රොට්ස්කිවාදීන්ගේ කර්තව්‍යය පවතින ස්ටැලින්වාදී පක්ෂවලට ඇතුල් වී ඒවායේ වාම යයි කියාගත් අංශයන්ට සහාය දීම ය.

පැබ්ලෝ නතරවූයේ දේශපාලනිකව සහ න්‍යායිකව සවිඥානික පෙරටු බලඇනියක අවශ්‍යතාව අවධාරනය කරන නිර්ධන පන්ති පක්ෂයක් පිලිබඳ සමස්ත මාක්ස්වාදී සංකල්පය ම ප්‍රතික්ෂේප කරමිනි. පැබ්ලෝට අනුව නායකත්වයේ භූමිකාව වෛෂයික බලවේගවල පීඩනය යටතේ වමට තල්ලු කරනු ලැබිය හැකි වෘත්තීය සමිතිවාදීන්, වාම ප්‍රතිසංස්කරනවාදීන්, සුලු ධනේශ්වර ජාතිකවාදීන් සහ විජිත හා පැරනි විජිත රටවල ජාතික විමුක්ති ව්‍යාපාරවලට වෙන් කර දෙනු ලැබිය හැකි ය. පුද්ගලිකව ඇල්ජීරියානු ජාතික විමුක්ති පෙරමුනේ (එෆ්එල්එන්) සේවයට බට පැබ්ලෝ එහි ජයග්‍රහනයෙන් පසුව වසර තුනක කාලයක් ඇල්ජීරියානු ආන්ඩුවට ද සම්බන්ධ විය.

පැබ්ලෝගේ ප්‍රහාරය හතරවන ජාත්‍යන්තරය බෙදාලී ය. ප්‍රන්ස ශාඛාවේ බහුතරය ඔහුගේ සංශෝධනවලට එරෙහිවූ අතර පියරේ ෆ්‍රැන්ක්ගේ නායකත්වයෙන් යුත් සුලුතරයක් විසින් නිලධාරිවාදී ලෙස නෙරපා හරිනු ලැබී ය. 1953 දී පැබ්ලෝවාදී සංශෝධනවලට ප්‍රබල විවේචනයක් මගින් ප්‍රතිචාර දැක්වූ ඇමරිකානු සමාජවාදී කම්කරු පක්ෂය (සකප) සියලුම සාධර්මික ට්‍රොට්ස්කිවාදීන්ගේ ජාත්‍යන්තර එකමුතුව සඳහා විවෘත ලිපියක් නිකුත් කලේ ය. ප්‍රන්ස බහුතරයත් ඇතුලත් වූ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක) ට පදනම වූයේ මෙම විවෘත ලිපිය යි.

කෙසේ වෙතත් සකප ය පැබ්ලෝවාදයට එරෙහි විරුද්ධත්වය වැඩි කලක් දරා සිටියේ නැත. ඊලඟ වසර 10ක කාලය තුල පැබ්ලෝවාදීන් සමග වෙනස්කම් වේගයෙන් අතහැර දැමූ සකප අවසානයේ 1963 දී එක්සත් ලේකම් මන්ඩලය බිහිකිරීමට ඔවුන් සමග එකතු විය. ඒ අතර ම එක්සත් ජනපද ශාඛාවේ නායකත්වය අර්නස්ට් මැන්ඩල් විසින් ගනු ලැබී ය. වඩ වඩා ද්විතීක භූමිකාවක් ඉටුකල පැබ්ලෝ වැඩිකල් නොයා එක්සත් ලේකම් මන්ඩලය හැර ගියේ ය. 1963 යලි එකමුතුවට පදනම වූයේ ෆිදෙල් කස්ත්‍රෝට සහ ඔහුගේ සුලු ධනේශ්වර ජාතිකවාදී "ජූලි 26 ව්‍යාපාරය" ට දුන් අවිවේචනාත්මක සහයෝගය යි. එක්සත් ලේකම් මන්ඩලයට අනුව කියුබාවේ බලය කස්ත්‍රෝ විසින් අත්පත් කරගනු ලැබීම, කස්ත්‍රෝ, අර්නස්ටෝ "චේ"

ගෙවාරා සහ අනෙකුත් කියුබානු නායකයන් " ස්වාභාවික මාක්ස්වාදීන්" ගේ භූමිකාව ඉටු කරමින් කම්කරු රාජ්‍යයක් ගොඩනැගීමට සමාන විය.

මෙම ඉදිරි දර්ශනය සේවය කලේ කිසිවිටක තමාගේ ම පාලන අවයව රහිතව සිටි කියුබානු කම්කරු පන්තිය නිරායුධ කිරීමට පමනක් නොව ස්ටැලින්වාදී සහ සුලු ධනේශ්වර ජාතිකවාදී සංවිධානවලට අවිවේචනාත්මක සහයෝගය දීම මහජනතාවන් මත ඔවුන්ගේ හස්තය ශක්තිමත් කිරීම මගින් ජාත්‍යන්තර කම්කරු පන්තිය ද නිරායුධ කිරීමට යි. එසේ කිරීම මගින් අධිරාජ්‍යවාදයේ ද්විතීක ඒජන්සියක් ලෙස ඉස්මතු වූ පැබ්ලෝවාදයේ භූමිකාව, පැරනි නිලධාරී තාන්ත්‍රික යන්ත්‍රනයන් කම්කරු පන්තියේ සහ තරුනයන්ගේ දැස් ඉදිරිපිට අපකීර්තියට පත්ව තිබූ තතු ඇතුලත වඩා වැදගත් විය.

සකපය සහ පැබ්ලෝවාදීන් එකමුතු වී යන්තම් වසරකට පසු මෙය ශ්‍රී ලංකාවේ දී සනාථ විය. 1964 දී මහජන පදනමක් සහිත ට්‍රොට්ස්කිවාදී පක්ෂයක් වූ ලංකා සම සමාජ පක්ෂය (ලසසප) ජාතිකවාදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග සහාග ආන්ඩුවකට ඇතුලත් විය. ආන්ඩුවට ඇතුලත් වීම මගින් ලසසපය ගෙවන ලද මිල වූයේ සිංහල ස්වෝත්තමවාදය වෙනුවෙන් රටෙහි දෙමල සුලුතරය අතහැර දැමීම යි. දෙමල සුලුතරයට එරෙහි වෙනස්කම් සහ දශක තුනක් පුරා ශ්‍රී ලංකාව පීඩාවට පත්කර ඇති සිවිල් යුද්ධයට මග පෑදූ මෙම පාවාදීමේ විපාකවලින් එරට තවමත් පීඩා විඳී.

1968 දී ප්‍රන්ස ධනේශ්වර පාලනය පවත්වාගෙන යාමට උපකාරී වීමේ දී ද පැබ්ලෝවාදියෝ තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කල හ. මූලික සිද්ධිවල දී ඔවුන්ගේ භූමිකාව විමසන අයෙකුට අංශ දෙකක් සිත්හි කා වදී: එනම් ස්ටැලින්වාදය පිලිබඳ ඔවුන්ගේ ක්ෂමාලාපී ආස්ථානය සහ ශිෂ්‍ය වටාපිටාව මත ආධිපත්‍යය දැරූ "නව වමේ" මාක්ස්වාද-විරෝධී න්‍යායන්ට ඔවුන් විවේචන රහිතව අනුගත වීම යි.

## ඇලේන් ක්‍රිවින් සහ ජේසීආර්

දෙවන ලෝක යුද්ධය අවසන් වනවිට හතරවන ජාත්‍යන්තරයට ප්‍රන්සය තුල සැලකිය යුතු බලපෑමක් තිබුනේ ය. යුද්ධ කාලය තුල බෙදී තිබුනු ප්‍රන්ස ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ජාත්‍යන්තර කොමියුනිස්ට් පක්ෂය (පීසීඅයි) බිහිකිරීම සඳහා යලි එක්සත් විය. වසර දෙකකට පසුව 1,000කට ආසන්න සාමාජිකත්වයක් සහිතව සිටි පීසීඅයි පක්ෂය පාර්ලිමේන්තු මැතිවරනයට අපේක්ෂකයන් 11 දෙනෙක් ඉදිරිපත් කල අතර ඔවුහු සියයට 2ත් 5ත් අතර ඡන්ද ප්‍රමානයක් ලබා ගත්හ. සංවිධානයේ පුවත්පත වූ ල වෙරිටේ කඩවල්වල විකුනන ලද අතර එය පුලුල් ශ්‍රාවකත්වයක් භුක්ති වින්දා ය. එහි බලපෑම අනෙකුත් සංවිධානවලට ද පැතිරිනි. සාමාජිකයින් 20,000ක් සහිත සමාජවාදී තරුන සංවිධානයේ සමස්ත නායකත්වය ට්‍රොට්ස්කිවාදීන්ට සහයෝගය දුන්හ. 1947 දී ප්‍රකොපයට ආන්ඩුවෙන් ඉවත්වීමට බලකල සහ රට සොලවාලූ වර්ජන ව්‍යාපාරය තුල පීසීඅයි සාමාජිකයෝ ප්‍රමුඛ භූමිකාවක් ඉටු කලහ.

කෙසේ වෙතත් පසුකාලීන වසරවල දී එහි අභ්‍යන්තර අංශවලින් ම පීසීඅයි පක්ෂයේ විප්ලවවාදී දිශානතියට යලි යලිත් ප්‍රහාර එල්ල විය. 1947 දී තියුනු ලෙස දකුනට ගිය සමාජ ප්‍රජාතන්ත්‍රවාදී එස්එෆ්අයිඕ (ජාත්‍යන්තර ප්‍රන්ස කම්කරු ශාඛාව) සංවිධානය එහි තරුන ව්‍යාපාරය විසුරුවා එහි ට්‍රොට්ස්කිවාදී නායකයාව නෙරපී ය. එවක පීසීඅයිහි ලේකම් වූ ඉවාන් ක්‍රෙයිපෝ විසින් නායකත්වය දුන් එහි දක්ෂිනාංශය ප්‍රතිචාර දැක්වූයේ කිසිදු විප්ලවවාදී ඉදිරි දර්ශනයක් ඉවත දමමිනි. වසරකට පසුව මෙම දක්ෂිනාංශය නෙරපන ලද්දේ එය ප්‍රන්ස දාර්ශනික ෂෝන් පෝල් සාත්‍රෙ නායකත්වය දුන් ප්‍රජාතාන්ත්‍රික විප්ලවවාදී සංගමය (ආර්ඩීආර්) නම් පුලුල් වාම ව්‍යාපාරය සමග එක්වීම සඳහා පීසීඅයි සංවිධානය විසුරුවා හල යුතු යයි තර්ක කිරීම හේතුවෙනි. ක්‍රෙයිපෝ ද ඇතුලුව නෙරපා හල පාර්ශවයේ බොහෝ නායක චරිත පසුකාලීනව පීඑස්යූව තුල යලි ඉස්මතු වූහ.

එම 1948 වසරේ ම කොර්නේලිස් කැස්ටෝරියේඩිස් සහ ක්ලෝඩ් ලෙෆෝට් විසින් නීත සමාජවාදය ද ම්ලේච්ඡත්වය ද නම් තවත් කන්ඩායමක් පීසීඅයි වෙතින් බිඳුනි. මෙම කන්ඩායම සීතල යුද්ධයේ ආරම්භයට ප්‍රතිචාර දැක්වූයේ ස්ටැලින්වාදී තන්ත්‍රය "නිලධාරිවාදී ධනේශ්වර" පද්ධතියක් තුල නව පන්තියක් නියෝජනය කරතියි යනුවෙන් තර්ක කරමින් සෝවියට් සංගමය වනාහි පිරිහුනු කම්කරු රාජ්‍යයකි ය යන ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනය ප්‍රතික්ෂේප කරමිනි. මෙම ආස්ථානය මත පදනම්ව එම කන්ඩායම මාක්ස්වාදයට විරුද්ධ ආස්ථානයන් ගනනාවක් වර්ධනය කලහ. සමාජවාදය ද ම්ලේච්ඡතවය ද කන්ඩායමේ ලියවිලි ශිෂ්‍ය ව්‍යාපාරය මත සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට නියමිත වූයේ එහි එක් සාමාජිකයෙකු වූ ෂෝන් ෆ්‍රංශුවා ලියෝතාද් පසුකාලීනව පශ්චාත් නූතනවාදය සමග අනන්‍ය වූ දෘෂ්ටිවාදය වර්ධනය කිරීමේ දී මූලික භූමිකාවක් ඉටු කලේ ය.

එහෙත් ප්‍රන්සය තුල ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයට බලගතු ම ප්‍රහාරය එල්ල කරන ලද්දේ පැබ්ලෝවාදය විසිනි. මයිකල් පැබ්ලෝගේ දියකර හැරීම්වාදී පිලිවෙත් සහ පසුව පැබ්ලෝවාදී සුලුතරය විසින් බහුතරයක් නෙරපා හරිනු ලැබීම නිසා පීසීඅයි සංවිධානය දේශපාලනිකව මෙන් ම සංවිධානාත්මකව ද දුර්වල කරනු ලැබී ය. පියරේ ලොම්බෙයා විසින් නීත පීසීඅයි බහුතරය පිලිබඳව මෙම ලිපිමාලාවේ අවසන් කොටසේ විමසා බැලේ. පියරේ ෆ්‍රෑන්ක් විසින් නීත පැබ්ලෝවාදී සුලුතරය භේදයෙන් පසුව සංකේන්ද්‍රනය වූයේ

ඇල්ජීරියානු යුද්ධයේ ජාතික විමුක්ති ව්‍යාපාරය වූ එෆ්එල්එන් වෙත ප්‍රායෝගික සහ සංවිධානාත්මක සහයෝගය ගොනුකර දීමට යි. 1960 ගනන්වල කම්හල් තුල එහි ආනුභාවය විශාල ලෙස සිදී ගොස් තිබුනි. එහෙත් ශිෂ්‍ය කව තුල සහයෝගයක් තිබුනු අතර 1968 දී එවැනි ස්ථර අතර වැදගත් භූමිකාවක් ඉටු කලේ ය. එහි නායක සාමාජික ඇලේන් ක්‍රිවින්, අරාජකවාදී ඩැනියෙල් කෝන්-බෙන්ඩිට් සහ මාඕවාදී ඇලේන් ගීස්මාට අමතරව ශිෂ්‍ය කැරලි තුල හොඳින් දැක පුරුදු මුහුනක් විය.

1955 දී දාහතර හැවිරිදි ක්‍රිවින් ස්ටැලින්වාදී තරුන ව්‍යාපාරයට බැඳුනු අතර 1957 මොස්කව් තරුන ජම්බෝරියකට සහභාගි වූ නිල ලැයිස්තුවේ සාමාජිකයෙක් විය. ඔහුගේ ස්වයං-චරිතාපදානයට අනුව ඔහුට ඇල්ජීරියානු එෆ්එල්එන් ව්‍යාපාරායේ සාමාජිකයින් මුනගැසුනේ ද ඇල්ජීරියාව පිලිබඳ කොමියුනිස්ට් පක්ෂ ප්‍රතිපත්ති කෙරෙහි විවේචනාත්මක ආකල්පයක් වර්ධනය කරගත්තේ ද එහි දී ය. වසරකට පසුව ඔහු ඇල්ජීරියානු ප්‍රශ්නය පිලිබඳව පැබ්ලෝවාදීන් සමග සහයෝගී වීම ඇරඹී ය. පීසීඅයි සංවිධානයේ පසුබිම පිලිබඳව තමන් මුල දී නො දැන සිටි බව ක්‍රිවින් කියා සිටිය ද ඔහුගේ සහෝදරයන් දෙදෙනෙක් එම සංවිධානයේ නායකත්වයට අයත් වූ තතු තුල එය විය හැක්කක් නො වේ. ඒ කෙසේ වෙතත් අවසානයේ 1961 දී පීසීඅයි වෙත ඔහු බැඳුනේ ස්ටැලින්වාදී ශිෂ්‍ය සංවිධානය වූ යූඊසී (කොමියුනිස්ට් තරුන සංගමය) තුල නිල වසයෙන් නොකඩවා ක්‍රියාකාරී වන අතර ම ය.

ක්‍රිවින් පීසීඅයිහි සහ එක්සත් ලේකම් මන්ඩලයේ නායකත්වය තුල ලහි ලහියේ ඉහලට නැගුනි. 1965, 24වන වියේ පටන් ක්‍රිවින්, පියරේ ෆ්‍රැන්ක් සහ මිචෙල් ලෙක්වීන්ට අමතරව පක්ෂයේ ද දේශපාලන කමිටුවේ ද ඉහල නායකත්වයට අයත් විය. එම වසරේ ම ඔහුව ලෙක්වීන්ට ආදේශකයක් ලෙස එක්සත් ලේකම් මන්ඩලයේ විධායක කමිටුවට නම් කරනු ලැබිනි.

1966 දී වාමාංශයේ පොදු ජනපති අපේක්ෂක ප්‍රංශුවා මිතරොංට සහාය දීම ප්‍රතික්ෂේප කිරීම නිසා පැරිස් (ල සෝබෝන්) විශ්ව විද්‍යාලයේ යූඊසීයේ ක්‍රිවින්ගේ කන්ඩායම ස්ටැලින්වාදී නායකත්වය විසින් නෙරපනු ලැබිනි. අනෙකුත් කැරලිකාරී යූඊසී කන්ඩායම් සමග සම්පූර්නයෙන් ම පාහේ සිසුන්ගෙන් තොරව සහ පීසීඅයි මෙන් ම ට්‍රොට්ස්කිවාදයට කැපවීම ප්‍රකාශ නො කොට ජේසීආර් (විප්ලවවාදී කොමියුනිස්ට් තරුනයෝ) ගොඩනැගීම කරා ඔහු ඉදිරියට ගියේ ය. 1969 අප්‍රේල් මාසයේ ජේසීආර් සහ පීසීඅයි සංවිධාන කොමියුනිස්ට් ලීගය (1974 පටන් විප්ලවවාදී කොමියුනිස්ට් ලීගය-එල්සීආර්) බිහිකිරීමට එක්සත් වූයේ වසරකට පෙර ප්‍රන්ස අභ්‍යන්තර කටයුතු ඇමතිවරයා සංවිධාන දෙක ම තහනම් කිරීමෙන් පසුව ය.

සංක්ෂිප්තව ගතහොත් ක්‍රිවින් 1968 දී ජේසීආර් සංවිධානය හිතුවක්කාරී උද්යෝගය සහ අඩු දේශපාලනික අත්දැකීම් මගින් සංලක්ෂිත තරුන සහ බොහෝ සේ බොලඳ සංවිධානයක් ලෙස දැක්වීමේ මං සොයා තිබුනි: "ඒ අවස්ථාවේ දී අපි සාමාන්‍ය වයස වැඩිහිටි භාවයේ නෛතික වයස වන අවුරුදු 21ට යන්තම් සමාන සාමාජිකයින් කිහිප සියයක් සහිත සංවිධානයක් වූයෙමු. වඩාත් ම වැදගත් කර්තව්‍යය වන එක් රැස්වීමක සහ විරෝධතාවක සිට අනෙකට යාම මගින් ධාවනය කරන ලද අප ට සිතීමට එතරම් කාලයක් නො තිබූ බව කීමට අවශ්‍ය නැත. අපගේ මධ්‍යස්ථ බලවේගයන්ගේ දැක්මට අනුව විශ්ව විද්‍යාල, වර්ජන සහ වීදි අපට ගෙදර මෙන් දැනුනි. ආන්ඩුව පිලිබඳ ප්‍රශ්නය විසඳීම සිදුවූයේ අපට කිසිදු බලපෑමක් නො තිබූ වෙනත් තලයක ය."(2)

ඇත්ත වසයෙන් ම එවැනි කියාපෑම් සරලව ම පදනම් රහිත ය. 1968 දී 27 හැවිරිදිව සිටි ඇලේන් ක්‍රිවින් සාපේක්ෂව තරුන වුවත් ඒ වනවිටත් සැලකිය යුතු දේශපාලන අත්දැකීම් සහිතව සිටියේ ය. ස්ටැලින්වාදී සංවිධාන පිලිබඳ අභ්‍යන්තර දැනුමක් සහිත වූ ඔහු එක්සත් ලේකම් මන්ඩලයේ සාමාජිකයෙකු ලෙස ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ඇතුලත ජාත්‍යන්තර අරගල ගැන මුලුමනින් ම දැනුවත් ය. මේ මොහොත වනවිට ඔහු විශ්ව විද්‍යාලයෙන් පිටව ගොස් තිබුන ද ජේසීආර් සංවිධානයේ ක්‍රියාවන්වලට නායකත්වය දීමට පෙරලා පැමින තිබුනි.

1968 මැයි-ජුනි සමයේ ජේසීආර්හි දේශපාලනික ක්‍රියාකාරීත්වය නො මේරූ අත්දැකීම් රහිත භාවයට සිඳවිය නො හැකි අතර ඒ වෙනුවට එහි ක්‍රියාකාරීත්වය ධාවනය කරන ලද්දේ සාධර්මික ට්‍රොට්ස්කිවාදයට එරෙහි අරගලයේ දී පැබ්ලෝවාදය වර්ධනය කල දේශපාලනික මාවත් විසිනි. හතරවන ජාත්‍යන්තරයෙන් බිඳී වසර 15කට පසුව එක්සත් ලේකම් මන්ඩලය එහි දේශපාලනික පමනක් නොව සමාජ දිශානතියෙන් ද වෙනස් වී තිබුනි. එය තව දුරටත් නිර්ධනීන්ගේ ධාරාවක් නොව සුලු ධනේශ්වර ව්‍යාපාරයක් විය. දශක එකහමාරක් පුරා ස්ටැලින්වාදී සහ ප්‍රතිසංසකරනවාදී අවයවවල වෘත්තීයවාදීන්ගේ පිලිසරන සොයා ගිය පැබ්ලෝවාදියෝ ජාතික ව්‍යාපාර සමග පෙමින් වෙලී සිටිය හ.

එවැනි ව්‍යාපාරවල සමාජ දිශානතිය පැබ්ලෝවාදීන්ට ම ත් දෙවන ගනයට පත්ව තිබුනි. කායික විද්‍යාවේ රාජධානියේ සිට දේශපාලනයට පාරිභාෂික පද මාරු කිරීමට අවසර තිබෙන තාක් දුරට මාක්ස්වාදයේ න්‍යායික සංශෝධනයක් ලෙස ඇරඹුනු දෙය ඔවුන්ගේ දේශපාලන දේහ ලක්ෂනවල ද ඓන්ද්‍රීය කොටසක් බවට පත්ව තිබුනි.

1848 යුරෝපීය විප්ලව රැල්ලේ පරාජයෙන් පාඩම් උකහා ගැනීමේ දී මාක්ස් සුලු ධනේශ්වරයේ ඉදිරි

දර්ශනය කම්කරු පන්තියේ ඉදිරි දර්ශනයෙන් පහත පරිදි වෙන්කොට දැක්වීය: "සමස්ත සමාජය ම විප්ලවවාදී නිර්ධනීන්ගේ අවශ්‍යතාවලට අනුව පරිවර්තනය කිරීමේ උවමනාවෙන් වෙනස් ව ප්‍රජාතාන්ත්‍රික සුලු ධනේශ්වරය පවතින සමාජයේ කොන්දේසි ඔවුන්ට දරාගත හැකි සහ සුවපහසු වන ආකාරයට වෙනස් කිරීමට අපේක්ෂා කරයි."(3) මෙම චරිතායනය 1968 පැබ්ලෝවාදීන්ට ඒ සමානව අදාල ය. පූර්වයෙන් මාක්ස් සහ එංගල්ස් සම්මුති විරහිතව සටන්වැද තිබුනු සංවිධාන, එනම් අරාජකවාදී සහ අනෙකුත් සුලු ධනේශ්වර සංවිධාන කෙරෙහි ඔවුන් දැක්වූ අවිවේචනාත්මක ආකල්පයෙන් මෙය පැහැදිලි වේ. එමෙන් ම ඔවුන් ඒ සමයේ මෙන් ම වර්තමානයේ ද වර්ගය, ලිංගිකත්වය සහ ලිංගික දිශානතිය වැනි ප්‍රයුක්තීන් කෙරහි දක්වන අර්ථභාරීත්වයෙන් සහ ලෙනින් එරෙහිව සටන් වැදුනු රුසියානු ජනතාවාදීන් මෙන් කම්කරු පන්තිය ගර්හාවෙන් සලකා තමන් ම ග්‍රාමීය සුලු ධනේශ්වරයට දිශාගත වන ජාතිකවාදී ව්‍යාපාරවල නායකයන් කෙරෙහි දක්වන උද්‍යෝගයෙන් ඒ බව සනාථ වේ.

## 'ට්‍රොට්ස්කිවාදී වීමට වඩා ගෙවාරාවාදී ය'

සියල්ලට ම වඩා ක්‍රිවින්ගේ ජේසීආර් සංවිධානය සංලක්ෂිත වූයේ 1963 සිදු වූ යලි එකමුතු වීමේ හදවතේ පැවති ප්‍රයුක්තිය වූ කියුබානු නායකත්වයට දැක්වූ මුලුමනින් ම අවිවේචනාත්මක සහයෝගයෙනි. එල්සීආර්හි ඉතිහාස කර්තෘ ෂෝන්-පෝල් සැලේස් " 68 මැයි මාසයට පෙර බොහෝ අංශවලින් ට්‍රොට්ස්කිවාදී වීමට වඩා ගෙවාරාවාදී සංවිධානයක අනන්‍යතාව" ගැන සඳහන් කරයි. (4)

1967 ඔක්තෝබර් 19 වන දින, එනම් බොලීවියාවේ දී චේ ගෙවාරා ඝාතනය කිරීමෙන් දින 10කට පසුව, ජේසීආර් සංවිධානය පැරිස් මියුචුලේතේහි දී ඔහු වෙන්වෙන් අනුස්මරන රැස්වීමක් සංවිධානය කලේ ය. ජේසීආර් රැස්වීම්වල හාත්පස ගෙවාරාගේ උඩුකය රූපය තිබුනි. 2006 දී පලකල තම ස්වයං-චරිතාපදානයේ ඇලේන් ක්‍රිවින් මෙසේ ලියයි:" නිසැකයේන ම තුන්වන ලෝකයේ රටවල විමුක්ති අරගලයන් සම්බන්ධයෙන් අපගේ වඩාත් ම වැදගත් යොමුව වූයේ අපව 'ට්‍රොට්ස්කියානු-ගෙවාරාවාදීන්' ලෙස හැඳින්වීමට හේතු වූ කියුබානු විප්ලවය යි...විශේෂයෙන් ම අපගේ දෑස්තුල විප්ලවවාදී සටන්කාමීත්වයේ පරමාදර්ශය මූර්තිමත් කලේ චේ ගෙවාරා ය."(5)

චේ ගෙවාරා උත්කර්ෂනය කිරීම සමගින් එල්සීආර් සංවිධානය කම්කරු පන්තිය තුල නායකත්වයක් ගොඩනැගීම සමග බැඳුනු දැවෙන ගැටලු මගහැරියේ ය. සිද්ධිවලින් ගහන ආර්ජන්ටීනියානු-කියුබානු විප්ලවවාදියාගේ ජීවිතය තුල සොයා ගතහැකි එකම පොදු සාධකය වන්නේ කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය කෙරෙහි නො සැලෙන විරෝධය යි. ඒ වෙනුවට ඔහු නියෝජනය කලේ කම්කරු පන්තියෙන් ස්වාධීනව ග්‍රාමීය ප්‍රදේශවල ක්‍රියාකාරී කුඩා සන්නද්ධ ගරිල්ලා සුලුතරයකට සමාජවාදී විප්ලවයට නායකත්වය දිය හැකි බවයි. මෙයට න්‍යායයක් හෝ දේශපාලන ඉදිරි දර්ශනයක් අවශ්‍ය නො වීය. කුඩා කන්ඩායමේ ක්‍රියාකාරීත්වය සහ අධිෂ්ඨානය තීරනාත්මක විය. කම්කරු පන්තියට සහ පීඩිත ජනතාවන්ට දේශපාලන විඥානයට ලඟාවීමට සහ ඔවුන්ගේ ම විමුක්ති අරගලයට නායකත්වය දීමට ඇති හැකියාව ප්‍රතික්ෂේප කෙරුනි.

1968 ජනවාරි මාසයේ ජේසීආර්හි *ඇවන්ට්ගාඩ් ජෙයුනිසේ* පුවත්පත ගෙවාරාගේ සංකල්ප මෙසේ පතුරුවා හලේ ය: "වත්මනෙහි පවත්නා තතු නො තකා කෙටි හෝ දිගු කාලයකට පසුව පවත්නා තන්ත්‍රයට එරෙහිව මුහුනට මුහුනලා අරගලයක් කිරීමට සමස්ත මහජනයා ඇදගත හැකි වනතෙක් තමන්ට ම වර්ධනය වීමට ගරිල්ලාවරුන්ට ආයාචනා කරනු ලැබේ."

කෙසේ වෙතත් ගෙවාරා ලතින් ඇමරිකාවේ ක්‍රියාවේ යෙදවූ ගරිල්ලා මූලෝපාය එලෙස ම පහසුවෙන් ප්‍රන්සයට මාරු කල නො හැකි විය. ඒ වෙනුවට මැන්ඩල්, ෆ්‍රැන්ක් සහ ක්‍රිවින් පෙරටු බලඇනියේ භූමිකාව පැවරුවේ ශිෂ්‍යයන්ට ය. ඔවුහු සිසුන්ගේ සාංසිද්ධික ක්‍රියාකාරකම් සහ පොලිසිය සමග කල වීදි සටන් උත්කර්ෂයට නැංවූහ. ගෙවාරාගේ සංකල්ප ගැඹුරු දේශපාලන දිශාවනතියේ වියදමින් අන්ධ ක්‍රියාකාරීත්වය සාධාරනීකරනය කිරීමට සේවය කලේ ය. එසේ කිරීම මගින් පැබ්ලෝවාදීහු ශිෂ්‍යයන් අතර නායක ක්‍රියාකලාපයක් ඉටුකල නව වාමාංශයේ ප්‍රති-මාක්ස්වාදී න්‍යායයන්ට අනුගත වූයේ අව්‍යාජ මාක්ස්වාදී දිශාවනතියකට මග අහුරමිනි.

"ට්‍රොට්ස්කිවාදී" ඇලේන් ක්‍රිවින්, අරාජකවාදී ඩැනියෙල් කෝන්-බෙන්ඩිට්, මාඕවාදී ඇලේන් ගීස්මාර් සහ 1968 සිද්ධිවල දී ප්‍රමුඛ වූ අනෙකුත් ශිෂ්‍ය නායකයන් අතර හඳුනා ගතහැකි දේශපාලනික වෙනස්කම් නො තිබින. ලතින් චතුරස්‍රයේ ඇති වූ වීදිසටන්වල ඔවුහු ඒ පස හෝ මේ පස පෙනී සිටිය හ. ෂෝන් පෝල් සැලේ මෙසේ ලියයි: "මැයි 6දා සිට 11දා දක්වා සතියේ ජේසීආර් සංවිධානය, කෝන්-බෙන්ඩිට් සහ අරාජකවාදීන් සමග බාධක රාත්‍රිය ඇතුලු සියලු විරෝධතාවලට සහභාගි වූයේ ඒවායේ පෙරමුනේ සිටිමිනි." (6) මැයි 9 දා ජේසීආර් සංවිධානය දීර්ඝ කාලයකට පෙර සංවිධානය කරන ලද රැස්වීමක් පැවැත්වූයේ ඒ වනවිට දරුනුතම වීදි සටන් පැවති ලතින් චතුරස්‍රයේ මියුචොලිතේ හි ය. 3,000කට වැඩි පිරිසක් සහභාගි වූ මෙම රැස්වීමේ එක් ප්‍රධාන කථිකයෙක් වූයේ ඩැනියෙල් කෝන්-බෙන්ඩිට් ය.

එම කාලසීමාවේ ම එක්සත් ලේකම් මන්ඩලය ලතින් ඇමරිකාව තුල චේ ගෙවාරාගේ ගරිල්ලා ඉදිරි දර්ශනයට කොන්දේසි විරහිතව සහාය දුන්නේ ය. 1969 මැයි මාසයේ එක්සත් ලේකම් මන්ඩලයේ 9වන ලෝක සම්මේලනයේ දී එය එහි දකුනු ඇමරිකානු ශාඛාවන්ට චේ ගෙවාරාගේ ආදර්ශය අනුගමනය කිරීමටත් ඔහුගේ ආධාරකරුවන් සමග එක්සත් වන ලෙසත් උපදෙස් දුන්නේ ය. මෙහි අර්ථය වූයේ ග්‍රාමීය ප්‍රදේශවල සිට නගර කරා අරගලය ගෙනඒම ඉලක්ක කරගත් සන්නද්ධ ගරිල්ලා අරගලයේ නාමයෙන් නාගරිකව පදනම් වූ කම්කරු පන්තියට පසුපස හැරවීම යි. මෙම මූලෝපායට සම්මේලනයේ දී සහාය දැක්වූ බහුතරයට අර්නස්ට් මැන්ඩල් සහ ප්‍රන්ස නියෝජිතයින් වූ පියරේ ෆ්‍රැන්ක් සහ ඇලේන් ක්‍රිවින් ඇතුලත් වූහ. ගරිල්ලා වර්ගයේ අරගල පිලිබඳ ඉදිරි දර්ශනයේ ව්‍යසනකාරී විපාක වඩ වඩා පැහැදිලි වෙමින් තිබුන තතු තුල එය එක්සත් ලේකම් මන්ඩලය තුල අර්බුදයකට මූලාශ්‍රය වුවත් ඔවුහු දස වසරකට නො අඩු කාලයක් එයට අචලව ඇලී ගැලී සිටිය හ. ගරිල්ලා වරුන්ගේ ක්‍රියාකාරකම් - පැහැරගෙන යාම්, නිවාස අඩස්සියට ගැනීම් සහ හමුදාව සමග ප්‍රචන්ඩ ගැටුම්- කම්කරු පන්තිය දේශපාලනිකව මංමුලා කිරීමට පමනක් සේවය කරද්දී එම මාවත අනුගමනය කල සහ ගරිල්ලා අරගලය තෝරාගත් දහස් ගනන් තරුන ජනයා මුග්ධ ලෙස තම ජීවිත කැප කලහ.

## ශිෂ්‍යයෝ "විප්ලවවාදී පෙරටු බලඇනිය" ලෙස

1968 ජුනි මාසයේ ජේසීආර් සංවිධානය තහනම් කිරීමට සුලු කලකට පෙර මැයි සිද්ධි අරබයා පියරේ ෆ්‍රැන්ක් විසින් ලියන ලද දීර්ඝ ලිපියකට අනුව සිසුන්ගේ භූමිකාව පිලිබඳව පැබ්ලෝවාදීන්ගේ අත්‍යන්ත අවිවේඡනාත්මක ආස්ථානය සනාථ වේ.

"මැයි මස පෙරටු බලඇනිය සාමාන්‍යයෙන් තරුනයෝ වූහ"යි ලියන ෆ්‍රැන්ක් එයට මෙසේ එකතු කරයිඃ "දේශපාලනිකව විෂම ජාතීය වූ ද සුලුතරයන් සංවිධානගතව සිටියා වූ පෙරටු බලඇනියට සමස්තයක් වසයෙන් ඉහල දේශපාලන මට්ටමක් තිබිනි. ව්‍යාපාරයේ අරමුන ධනවාදය පෙරලා දමා සමාජවාදය ගොඩනගන සමාජයක් ස්ථාපනය කිරීම බව එය හඳුනා ගත්තේ ය. 'සමාජවාදය කරා සාමකාමී සහ පාර්ලිමේන්තු මාවත' සහ 'සාමකාමී සහජීවනය' යන පිලිවෙත් සමාජවාදය පාවාදීමක් බව ද එය හඳුනා ගති. සියලු ආකාර සුලු ධනේශ්වර ජාතිකවාදයන් ප්‍රතික්ෂේප කල එය කැපී පෙනෙන ලෙස ජාත්‍යන්තරවාදය ප්‍රකාශනය කලේ ය. ශක්තිමත් නිලධර විරෝධී විඥානයක් සහිතව සිටි එය තම කාන්ඩයන් අතර ප්‍රජාතන්ත්‍රවාදය සහතික කිරීමට නිර්දය ලෙස කැපවිය." (7)

සෝබෝන් සරසවිය "'ද්වන්ද්ව බලයේ' වඩාත් ම සංවර්ධිත රූපාකාරය" සහ "ප්‍රන්ස සමාජවාදී සමූහාන්ඩුවේ ප්‍රථම භූමිය" යයි කීමට තරම් දුරගිය ෆ්‍රැන්ක් මෙසේ ද ලිවීයඃ "නව ධනවාදී පරිභෝජක සමාජයට එරෙහිව ශිෂ්‍යයන්ව උද්‍යෝගිමත් කරන දෘෂ්ටිවාදය, ඔවුන් අරගලයේ දී භාවිතා කරන උපක්‍රම, ඔවුන් (ඔවුන්ගෙන් බහුතරය රාජ්‍යයේ සුදූකරපටි සේවකයන් හෝ ධනපතියන් බවට පත්කරනු ඇති) සමාජය තුල දැනට දරන හා අනාගතයේ දැරීමට නියමිත යන මේවා මෙම අරගලයට සමාජවාදී, විප්ලවීය සහ ජාත්‍යන්තරවාදී ස්වභාවයක් අත් කර දුනි." ශිෂ්‍ය අරගලය "විප්ලවීය මාක්ස්වාදී අර්ථයකින් ගත්කල ඉතා ඉහල දේශපාලනික මට්ටමක්" ප්‍රදර්ශනය කලේ ය. (8)

යථාර්ථයේ දී මාක්ස්වාදී අර්ථයකින් සිසුන් අතර විප්ලවවාදී විඥානයක ඡායා මාත්‍රයක් නො තිබුනි. ශිෂ්‍යයන් අතර පැවතුනු දේශපාලනික සංකල්පවල මූලයන් ඊනියා "නව වාමාංශයේ" න්‍යායික අවි ගබඩාවේ වූ අතර ඒවා වසර ගනනාවක් පුරා මාක්ස්වාදයට එරෙහිව වර්ධනය කරනු ලැබ තිබිනි.

ප්‍රන්සයේ '68 සිද්ධීන් ගැන ඉතිහාසඥ ඉන්ග්‍රිඩ් ගිල්චර්-හෝල්ට් මෙසේ ලියයිඃ "ක්‍රියාවලිය ඉදිරියට ධාවනය කල ශිෂ්‍ය කන්ඩායම් නිශ්චිතව ම එක්කෝ නව වමේ බුද්ධිමය උපදේශකයන් මත ද නැතහොත් ඔවුන්ගේ තේමාවන් සහ විවේචනයන් -විශේෂයෙන් ම 'සමාජවාදය ද මිලේච්ඡත්වය ද' සහ 'තර්ක' යන ඒවා වටාසිටි 'තත්ත්වවාදී ජාත්‍යන්තරයේ' ලියවිලි මත රඳ සිටියහ. ඔවුන්ගේ (ඍජු සහ ප්‍රකෝපකාරී) ක්‍රියාකාරී මූලෝපාය සහ ඔවුන්ගේ ම (ආධානග්‍රාහ විරෝධී, නිලධර විරෝධී, සංවිධාන විරෝධී, ආඥාදායක විරෝධී) ස්වයං-සංකල්පනය යන දෙකම නව වාමාංශයේ අක්ෂ පද්ධතියට මොනවට ගැලපුනි." (9)

නව වාමාංශය කම්කරු පන්තිය දුටුවේ විප්ලවවාදී පන්තියක් ලෙස නොව පරිභෝජනය සහ මාධ්‍ය මගින් ධනේශ්වර සමාජයට මුලුමනින් ම අන්තර් ග්‍රහනය වූ පසුගාමී ජනතාවක් ලෙස ය. නව වාමාංශය සිය සමාජ විශ්ලේෂනයේ දී පරත්වාරෝපනය යන්න අතිශයින් ම මනෝවිද්‍යාත්මක හෝ සාංදෘෂ්ටිකවාදී අර්ථයකින් අර්ථ ගන්වමින් ධනේශ්වර සූරාකෑම වෙනුවට පරත්වාරෝපනයේ භූමිකාව අවධාරනය කලේ ය. "විප්ලවය"ට නායකත්වය දෙන්නේ කම්කරු පන්තිය නොව බුද්ධි ස්ථරය සහ සමාජයේ අද්දර සිටි කන්ඩායම් ය. නව වාමාංශයට අනුව ගාමක බලය වන්නේ ධනේශ්වර සමාජයේ පරස්පර විරෝධයන් නොව පුනරුදයට පත් තීරුවක "විවේචනාත්මක චින්තනය" සහ ක්‍රියාකාරකම් ය. තව දුරටත් විප්ලවයේ එල්ලය වන්නේ බලයේ සහ හිමිකාරීත්වයේ සම්බන්ධතා පරිවර්තනය කිරීම නොව ලිංගික සබඳතාවලට විකල්පව සමාජ හා සංස්කෘතික වෙනස්කම් ය. නව වමේ නියෝජිතයන්ට අනුව එවැනි සංස්කෘතික වෙනස්කම් සමාජ විප්ලවයකට පූර්වාවශ්‍යතා වේ.

ප්‍රන්සයේ සහ ජර්මනියේ ප්‍රකට ශිෂ්‍ය නායකයන්ගෙන් දෙදෙනකු වූ ඩැනියෙල් කෝන්-බෙන්ඩිට් සහ රූඩි ඩච්කේ යන දෙදෙනා ම, ප්‍රකෝපකාරී ක්‍රියා ආධාරයෙන් විඥ්ඥානයේ වෙනස්කම් ඇතිකිරීම දේශනා කල "තත්වවාදී ජාත්‍යන්තරයේ" බලපෑමට නතුව සිටිය හ. ප්‍රථමයෙන් ඩාඩා සහ අධිතාත්විකවාදයේ සම්ප්‍රදායන් තුල මූලයන් සහිත කලාකරුවන් කන්ඩායමක් ලෙස සංවිධානය වූ තත්වවාදීහු ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේ වැදගත් කම අවධාරනය කලහ. තත්වවාදීන් පිලිබඳ මෑතකාලීන ලිපියක් දක්වන පරිදි: "සකල ව්‍යාප්ත විඩාබර බවින් ඇතිවන දීර්ඝ නිද්‍රාවේ සර්වබලධාරී ග්‍රහනයේ සිටින්නවුන් ඔසවා ඔවුන්ගේ විඥ්ඥානය විප්ලවීකරනය කලහැක්කේ ක්‍රියාකාරවාදී කඩාකප්පල්කාරීත්වය, රැඩිකලීකරනය, වැරදි භාවිතය, යලි ඇගයීම සහ දෛනික සංයුක්තභාවයේ කෙලිලොල් ප්‍රතිනිෂ්පාදනය යන ඒවාට ය." (10)

එවැනි ආස්ථාන වනාහි මාක්ස්වාදයෙන් දුරස්ථ ආලෝක වර්ෂයන් ය. ඔවුහු මගහැරිය නො හැකි පන්ති ගැටීම්වලින් සංලක්ෂිත සමාජයක් තුල තම ස්ථානය පදනම් වී ඇති කම්කරු පන්තියේ විප්ලවකාරී භූමිකාව ප්‍රතික්ෂේප කරති. විප්ලවයේ ගාමක බලය වන්නේ වෛෂයික පදනම් සහිත පන්ති අරගලය යි. එහි විපාකයක් ලෙස මාක්ස්වාදී විප්ලවවාදීන්ගේ කර්තව්‍යය වන්නේ ප්‍රකෝපකාරී ක්‍රියා මගින් කම්කරු පන්තිය විද්‍යුතනය කිරීම නොව ඒ වෙනුවට එහි දේශපාලනික විඥ්ඥානය ඔසවා එයට එහි ම ඉරනමේ වගකීම භාර ගතහැකි වන ආකාරයට විප්ලවවාදී නායකත්වය සම්පාදනය කිරීම යි.

පැබ්ලෝවාදීහු හුදෙක් අරාජකවාදීන්, මාඕවාදීන් සහ අනෙකුත් සුලු ධනේශ්වර කන්ඩායම් ලතින් චතුරස්‍රයේ විරෝධතා මගින් "විප්ලවීය මාක්ස්වාදී අර්ථයකින් ඉතා ඉහල දේශපාලනික මට්ටමක්" ප්‍රදර්ශනය කලා යයි (පියරේ ෆ්‍රැන්ක්) කියා පෑවා නො වේ: ඔවුහු ම ත් එවැනි දේශපාලන අදහස් ඉදිරියට දැමූ අතර ඉහත කී අයගේ අතිවික්‍රම ක්‍රියාවන්වලට උද්යෝගයෙන් සහභාගි වූහ.

අරාජිකවාදීන් ලතින් චතුරස්‍රයේ අවුලුවාලූ වීදි සටන් කම්කරුවන් සහ ශිෂ්‍යයන් දේශපාලනිකව අධ්‍යාපන ගතකිරීමට කිසිවක් නො කල අතර ප්‍රන්ස රාජ්‍යයට කවර කලෙකවත් ගැඹුරු තර්ජනයක් එල්ල නො කලා හ. 1968 දී රාජ්‍යය සතුව නවීන පොලිස් යන්ත්‍රනයක් සහ විජිත යුද්ධ දෙකකින් පදම්වුනු සහ නේටෝවේ ආධාරය මත රඳපැවැත්මේ හැකියාව තිබුනු හමුදාවක් තිබිනි.

19වන ශතවර්ෂයේ භාවිතා කරන ලද විප්ලවීය උපක්‍රම, එනම් අගනුවර වීදිවල බාධක ඉදිකිරීම, මගින් එම රාජ්‍යය සොලවාලිය නො හැකි වනු ඇත. ලතින් චතුරස්‍රයේ වීදි සටන්වලට ලාක්ෂනික වූ සුවිසල් ප්‍රචන්ඩතාවන්ට ප්‍රධාන කොට වගකිව යුත්තේ ආරක්ෂක හමුදා බව සත්‍ය වුවත් ශිෂ්‍යයන් ඉතා කැමැත්තෙන් වීදි බාධකවලට පොලීසිය සමග බලල්-මී සෙල්ලමේ යෙදුනු ලදරු විප්ලවීය අලංකාරවාදයට නිසැක සාක්ෂි තිබේ.

## මතු සම්බන්ධයි

### සටහන්:


1. මිචෙල් සැන්කාරිනි-ෆෝනෙල්, '68: අන් හිස්ටොයිර් කලෙක්ටිව්හි "1962-1968: ල චැම්ප් ඩි පොසිබල්", පැරිස්: 2008

2. ඩැනියෙල් බෙන්සේඩ්, ඇලේන් ක්‍රිවින්, *මෙ සි! 1968-1988 : රිබෙල්ස් එට් රිපෙන්ටිස්* , මොන්ට්‍රියෙල්: 1988, 39 පිටුව

3. කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්, "ස්පීච් ටු ද සෙන්ට්‍රල් ඔතෝරිටි ඔෆ් ද කොමියුනිස්ට් ලීග්" ( 'කොමියුනිස්ට් ලීගයේ මධ්‍යම අධිකාරයට කල කථාව)

4. ෂෝන්-පෝල් සැලේස්, *ල ලීග් කොමියුනිස්තේ රෙවලූෂනරේ,* (විප්ලවවාදී කොමියුනිස්ට් ලීගය) රෙනේ: 2005, 49 පිටුව

5. ඇලේන් ක්‍රිවින්, *සා ටේ පැසේරා ඇවක් ලේජ්,* ෆ්ලැමේරියන්: 2006, 93-94 පිටු

6. ෂෝන්-පෝල් සැලේස, ඉහත කී කෘතිය,52 පිටුව

7. පියරේ ෆ්‍රැන්ක්, "මැයි 68: ප්‍රිමියරේ ෆේස් ඩි ලා රෙවලූෂන් සොෂලිස්ගේ ෆ්‍රංශුවා"

8. පියරේ ෆ්‍රැන්ක්, ඉහත කී කෘතිය

9. ඉන්ග්‍රිඩ් ගිල්ෂර්-හෝට්ලේ, 1968: වොම් එරෙයිග්නෙස් සම් මිතෝස්හි මේ 68 ඉන් ෆ්‍රැන්ක්‍රීච්, ෆ්‍රැන්ක්ෆර්ට් ආම් මේන්: 2008, 25 පිටුව

10. ආච්ප්ලස් 183, සේයිස්ක්‍රිෆ්ට් ෆර් ආකිටෙක්ටර් අන්ඩ් ස්ටාඩ්ටේබෝ, 2007 මැයි


© www.wsws.org